සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

66709

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை மதிப்பீடு - 2019
Third Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 01 |

සැලකිය යුතුයි :

i. සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ii. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන වරණවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිල්ලෙන් කියවා, ඒවාද පිළිපදින්න.

---

1. "මෙවන් පුතකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති. මෙවැනි ස්වාමියෙක් ඇති බිරිය ද නිවීම ලැබ සිටින්නියකි." යනුවෙන් ප්‍රකාශ කළේ,
   1. ප්‍රජාපතී ගෝතමී විසිනි.
   2. කිසා ගෝතමී විසිනි
   3. යසෝදරා දේවිය විසිනි.
   4. මහාමායා දේවිය විසිනි.

2. තමා විසින්ම පිළිපැද ඇස්පනාපිට මෙලොවදීම ප්‍රතිඵල දැකගත හැකි බැවින් ධම්ම රත්නය
   1. ස්වක්ඛාත වන සේක.
   2. අරහං වන සේක.
   3. සන්දිට්ඨික වන සේක.
   4. අකාලික වන සේක.

3. සිතෙහි කයෙහි නිදිමත ගතිය උදාසීනකම පවතී නම් පාඩම් කළ දෙය මතකයට නොඑයි. එම නිදිබර උදාසීනකම හැඳින්වෙන්නේ
   1. කාමච්ඡන්දය ලෙස ය.
   2. ව්‍යාපාදය ලෙස ය.
   3. විචිකිච්ඡාව ලෙස ය.
   4. ථිනමිද්ධය ලෙස ය.

4. සසර දුකට මුල්වන රාගාදී කෙලෙස් මුල් සහමුලින්ම උදුරා දමා චිත්ත පාරිශුද්ධිය ඇති කරවන භාවනාව හඳුන්වන්නේ
   1. විපස්සනා භාවනාව ලෙස ය.
   2. සමථ භාවනාව ලෙස ය.
   3. චිත්ත භාවනාව ලෙස ය.
   4. සමාධි භාවනාව ලෙස ය.

5. වැලිවිට අසරණසරණ සිරි සරණංකර හිමි විසින් රචිත ග්‍රන්ථ පමණක් ඇතුළත් වන පිළිතුර වන්නේ
   1. පොහොය දිනය, මුණිගුණාලංකාරය,සාරාර්ථ සංග්‍රහය.
   2. මුණිගුණාලංකාරය, සාරාර්ථ සංග්‍රහය, සතර බණවර සන්නය.
   3. ධර්ම විනිශ්චය, සාරාර්ථ සංග්‍රහය, මුණිගුණාලංකාරය.
   4. සතර බණවර සන්නය, ධර්ම විනිශ්චය, පොහොය දිනය.

6. "උට්ඨානවතෝ සතිමතෝ .........." යන ධම්මපද ගාථාවෙහි එන සුචිකම්ම යන්නෙන් අදහස් වන්නේ
   1. උත්සාහවන්ත සහ නොපසුබට බව
   2. එළඹසිටි සිහිය
   3. සිත, කය, වචනයෙන් නිවැරදි දේ කිරීම
   4. සිත,කය, වචනය හික්මීම

7. ධනවත් පුද්ගලයෙකු පව්ටු මිත්‍ර සේවනය, මත් ද්‍රව්‍ය භාවිතය හා සූදු ක්‍රීඩාවෙහි යෙදීම නිසා තමා සතු සියළු ධනය විනාශ වී දිළින්දෙකු බවට පත්විය. ඔහු අනුගමනය කර ඇත්තේ
   1. පස් පව් ය
   2. භෝග විනාශමුඛ ය
   3. දස අකුසලය
   4. වසල කරුණු ය

8. සිල්වත් වීමේ ආනිසංසයක් වන්නේ,
   1. ධාරණ ශක්තිය වැඩිදියුණුවීම
   2. සිත එකඟ කර ගැනීමට හැකිවීම
   3. අසහනය දුරුවී සිත පිරිසිදු වීම
   4. මහත් වූ භෝග සම්පත් ලැබීම

9. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන සදිසාවන් අතරින් ගරු කිරීම, අවමන් නොකිරීම, ගෙදර වගකීම් පැවරීම, ඇඳුම් පැළඳුම් සපයා දීම යන යුතුකම් ඉටුකරනු ලබන්නේ,
   1. ස්වාමියා විසින් සේවකයාට
   2. ස්වාමියා විසින් බිරිඳට
   3. බිරිඳ විසින් ස්වාමියාට
   4. සේවකයා විසින් ස්වාමියාට

10. "පටිසෝතගාමී" තැනැත්තාගේ ලක්ෂණයක් වන්නේ
   1. පස්කම් සැපතට ගිජුවීමයි
   2. අවෛරීව ජීවත්වීමයි
   3. දුසිරිතට පෙළඹීමයි
   4. නීති විරෝධීව ක්‍රියා කිරීමයි

11. මට්ටකුණ්ඩලී නම් තරුණයාට මරණින් පසු දෙව්ලොව ඉපදීමට හේතු වූ කර්මය වන්නේ
   1. ගරුක කර්මයයි
   2. ආසන්න කර්මයයි
   3. ආචිණ්ණ කර්මයයි
   4. කටත්තා කර්මයයි

12. අතීත ලංකාවේ දුප්පත් ගොවි ගෙදරක උපන් කාන්තාවක් දුටුගැමුණු මහ රජතුමාගේ අගබිසෝ තනතුරට පත්විය. මේ සඳහා බලපෑවේ
   1. ගති සම්පත්ති යයි.
   2. කාල සම්පත්ති යයි.
   3. ප්‍රයෝග සම්පත්ති යයි.
   4. උපධි සම්පත්ති යයි.

13. ඇති වී නැති වී යන බැවින් සංස්කාර ඒකාන්ත වශයෙන් ම අනිත්‍ය ය. සංස්කාර ඉපදී නැති වන්නේ ය. ඒ සංස්කාරවල සංසිඳීම සැපයකි. ........... යන අදහස දෙන පරිදි පාලි පාඨයේ මුල් පදය වන්නේ
   1. "අනේක ජාති සංසාරං .........."
   2. "අනිච්ඡාවත සංඛාරා .........."
   3. "අක්කොච්ඡිමං අවධිමං ......."
   4. "අත්තනාව කතං පාපං ........"

14. බුදු දහමේ මූලිකම හරය වන චතුරාර්යය සත්‍යය ඇතුළත් සූත්‍ර දේශනාව වනුයේ
   1. මහා මංගල සූත්‍රය
   2. සිගාලෝවාද සූත්‍රය
   3. කරණීයමෙත්ත සූත්‍රය
   4. දම්සක් පැවතුම් සූත්‍රය

15. බුදුරජාණන් වහන්සේ දහවන වස් කාලය ගත කළේ,
   1. ඉසිපතන මිගදායේ ය
   2. වේළුවනාරාමයේ ය
   3. පාරිලෙයා වනයේ ය
   4. ජේතවනාරාමයේ ය

16. මානසික රෝගවලින් තොර වූ පුද්ගලයා වන්නේ
1. වෛද්‍යවරයා ය
2. ගුරුවරයා ය
3. සංඝයා වහන්සේ ය
4. රහතන් වහන්සේ ය

17. පමණ දැන ආහාර වැළඳූ විට සෙමෙන් දිරවන බවත්, ආයුෂය වැඩෙන බවත්, පැහැදිලි කෙරෙන සූත්‍ර දේශනාව වන්නේ
1. දෝණපාක සූත්‍රය
2. පරාභව සූත්‍රය
3. මංගල සූත්‍රය
4. රතන සූත්‍රය

18. ආහාර ගත් පසු ඇඳුම ඇඳ ගැනීමටවත් බැරි තරමට, ඇඳුම ගැනවත් නොසලකා ආහාර ගන්නා තැනැත්තා හඳුන්වනුයේ
1. ආහාර හත්ථක ලෙස ය
2. අලංසාටක ලෙස ය
3. තත්ථාවට්ටක ලෙස ය
4. භුත්තවමිතක ලෙස ය

19. සූත්‍ර, විනය, අභිධර්ම යන ත්‍රිපිටකයට විභාෂා නම් සර්වාස්තිවාදී අටුවා ග්‍රන්ථ සම්පාදනය කළේ
1. පළමු ධර්ම සංගායනාවේ දී ය
2. දෙවන ධර්ම සංගායනාවේ දී ය
3. ත්‍රිපිටක සංගායනාවේ දී ය
4. කණිෂ්ක ධර්ම සංගායනාවේ දී ය

20. ඉන්දියාවේ අජන්තා සිතුවම්වලට නෑකම් කියන අනුරාධපුර යුගයේ අඳින ලද සිතුවම් හමුවන්නේ
1. සීගිරි ලෙන්වල ය
2. මහියංගන ධාතු ගර්භයේ ය
3. දිඹුලාගල ලෙන්වල ය
4. තිවංක පිළිම ගෙයි ය

21. පොළොන්නරු යුගයේ සඳකඩ පහනේ දැකිය හැකි සත්ව රූප වන්නේ
1. ඇතා, අශ්වයා, සිංහයා
2. ඇතා, අශ්වයා, ගවයා
3. ඇතා, ගවයා, සිංහයා
4. ගවයා, අශ්වයා, සිංහයා

22. පොළොන්නරු යුගයේ රචනා වී ඇති ධර්ම ප්‍රදීපිකාවට වස්තු විෂයය වී ඇත්තේ
1. නව අරහාදී බුදුගුණය යි
2. පුරිසදම්ම සාරථී ගුණය යි
3. බෝධීන් වහන්සේ වටා ගෙතුනු කතා යි
4. බුදුරදුන්ගේ දේශනා විලාසය යි

23. මිනිස් තිරිසන් ආදී සෑම කොටසකටම ආරක්ෂාව ලබා දිය යුතු බව ප්‍රකාශ කෙරෙන බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්මය වනුයේ
1. දසරාජ ධර්ම ය
2. දස සක්විත්වත් ය
3. සප්ත අපරිහාණීය ධර්ම ය
4. සතර සංග්‍රහ වස්තු ය

24. බුදුරජාණන් වහන්සේගේ බාහිර රූපකාය කෙරෙහි ප්‍රසාදය ඇති කරගත් තෙරුන් වහන්සේ වන්නේ,
1. බක්කුල හිමි ය
2. ආනන්ද හිමි ය
3. වක්කලී හිමි ය
4. නන්ද හිමි ය

25. "ගිලනුන්ට උපස්ථාන කරන්නා මට උපස්ථාන කරන්නකු වේ." යන ප්‍රකාශය කරන ලද්දේ,
1. බුදුරජාණන් වහන්සේ විසිනි
2. පූතිගත්තතිස්ස හිමි විසිනි
3. ගිරිමානන්ද හිමි විසිනි
4. මුගලන් හිමි විසිනි

26. බුද්ධත්වයට පත්වීමේ දී බෝසතාණන් වහන්සේ මුහුණ දුන් අභියෝගයකි,
1. දසමාර සේනා පරාජය වීම ය
2. දේවදත්ත සිදුකළ විරුද්ධවාදීකම ය
3. සුන්දරී පරිබ්‍රාජිකාවගේ දෝෂාරෝපණ ය
4. චිංචිමානවිකාවගේ නින්දා අපහාස ය

27. බුදුබව පතන බෝධිසත්ත්වයකු සියළු පාරමිතා ත්‍රිවිධාකාරයකින් පූර්ණය කළ යුතු ය. සස ජාතකයෙන් පැහැදිලි වන්නේ බෝසතාණන් වහන්සේ
1. දානය දුන් ආකාර යයි
2. දාන පාරමී සම්පූර්ණ කළ ආකාර යයි
3. දාන උපපාරමී පූර්ණය කළ ආකාර යයි
4. දාන පරමත්ත පාරමී සම්පූර්ණ කළ ආකාර යයි

28. "දුර ගමන් කරන, තනිව හැසිරෙන, ශරීරයක් නැති ගුහාවක වාසය කරන සිත දමනය කර ගන්නා තැනැත්තෝ මාරයාගේ බැම්මෙන් මිදෙති. ...." යන අදහස දෙන ධම්මපද ගාථාවේ මුල් පදය වන්නේ,
1. "මනෝ පුබ්බංගමා ධම්මා ......"
2. "අක්කොච්ඡි මං අවධිමං ........"
3. "අක්කෝධේන ජිනේ කෝධං ......."
4. "දූරගමං ඒකචරං ........"

29. පූජ්‍ය රේරුකානේ චන්ද්‍රවිමල නාහිමි විසින් රචිත "පොහොය දිනය" ග්‍රන්ථය
1. පෙහෙවස් සමාදන් වූවන්ට උපදෙස් සපයයි
2. දහම් ගැටළුවලට පිළිතුරු සපයයි
3. බෞද්ධ ජීවිතයක් ගතකිරීමට උපදෙස් සපයයි
4. දස පාරමිතා විස්තර කරයි

30. යමෙක් පව් කළොත් ඉන් ඔහුව කෙලෙසෙන බවත්, එසේ නොකළහොත් ඔහු පිරිසිදු වන බවත්, එක් අයෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකි බවත්, ප්‍රකාශ කෙරෙන ධම්මපද ගාථාවේ මුල් පදය වන්නේ
1. "නතං කම්මං කතං සාධු ....."
2. "තංච කම්මං කතං සාධු ....."
3. "අත්තනාව කතං පාපං ....."
4. "අචරිත්වා බ්‍රහ්මචරියං ....."

31. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ශීල ශික්ෂාවට අයත් මාර්ගාංගයක් වන්නේ,
1. සම්මා දිට්ඨි ය
2. සම්මා සංකප්ප ය
3. සම්මා ආජීව ය
4. සම්මා වායාම ය

32. කාලාම සූත්‍රයේ දේශිත කරුණු අතරින් යම් කරුණක් පිළිගත යුත්තේ එම කරුණ
1. පාරම්පරිකව පිළිගත් නිසා ය.
2. ආරංචි මගින් දැනගත් නිසා ය.
3. න්‍යායට හා තර්කයට ගැළපෙන නිසා ය.
4. කුසල් බව හා නිවැරදි බව ප්‍රත්‍යක්ෂ වන නිසා ය.

33. "ජන්තුපාල" උපතින් ආබාධිත අයෙකි. ඉතා කුඩාවට වැඩුණු අප්‍රාණික පාද යුගලයක් හා දෙපොළකින් නැවුණු අත් දෙකක් හිමි ඔහුට ඇවිදීමට නොහැකි ය. මෙලෙස බොහෝ ආබාධ සහිතව ඉපදීමට හේතු විය හැක්කේ, චූල්ලකම්ම විභංග සූත්‍රයට අනුව
1. සතුන් මැරීම නිසා ය
2. සතුන්ට හිංසා පීඩා සිදුකළ නිසා ය
3. ද්වේෂයෙන් කටයුතු කළ නිසා ය
4. අන් සැපතට ඊර්ෂ්‍යා කළ නිසා ය

34. අනුලෝම පටිච්ච සමුප්පාද ධර්මයට අනුව "තණ්හාව" ඇතිවීමට බලපාන හේතුව වන්නේ,
1. ඵස්ස ය
2. උපාදාන ය
3. සළායතන ය
4. වේදනා ය

35. භික්ෂූන් වහන්සේලාගේ කායික සහ මානසික නිරෝගී බව සඳහා බුදුරදුන් අනුදැන වදාළේ
1. සෙනසුන වතයි
2. පෙරහන් කඩය යි
3. විපස්සනා භාවනාවයි
4. සක්මන් භාවනාවයි

36. දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු වූයේ,
    1. වජ්ජි පුත්තක භික්ෂූන්ගේ දස අකැප වස්තුවයි.
    2. සුභද්‍ර භික්ෂුවගේ අභද්‍ර වචනයයි
    3. දුසිල්වත් භික්ෂූන් සඝුන්ගත වීමයි
    4. නිකාය භේදය නිසා දහම අතුරුදහන්වීමයි

37. ත්‍රිවිධ චෛත්‍යය වන්නේ,
    1. බුදු, පසේබුදු, මහරහතන්
    2. රුවන්වැලිසෑය, ජේතවනාරාමය, අභයගිරිය
    3. ස්තූපය, බෝධිය, බුදුපිළිම
    4. ඇසතු, නා, නුග

38. බුදුරජාණන් වහන්සේ විසින් ධර්ම දේශනා කරන අවස්ථාවේ දහම් කරුණු පැහැදිලි කිරීම නිරූපණය කෙරෙන මුද්‍රාව වන්නේ,
    1. ධ්‍යාන මුද්‍රාව යි
    2. අභය මුද්‍රාව යි
    3. විතර්ක මුද්‍රාව යි
    4. ධර්මචක්‍ර මුද්‍රාව යි

39. බුදු දහමේ විස්තර කෙරෙන "චතු අප්පමඤ්ඤාව" යනු
    1. සතර බ්‍රහ්ම විහරණයි
    2. සතර සංග්‍රහ වස්තුවයි
    3. සතර අගතියයි
    4. සතර ආර්ය සත්‍යයයි

40. "කිසිම දවසක දියුණුව ගැන සිතා හෝ අනුන්ගේ අභිවෘද්ධිය ගැන සිතා හෝ තම අඹුදරුවන්ගේ අභිවෘද්ධිය ගැන සිතා හෝ අධාර්මිකව නම් ධනය ඉපයීමට පෙළඹෙන්න එපා." මෙම උපදේශය ඇතුළත් පාළි පාඨයේ මුල් පදය වන්නේ
    1. "නතං කම්මං කතං සාධු ....."
    2. "න අත්ත හේතු න පරස්ස හේතු ....."
    3. "තංච කම්මං කතං සාධු ....."
    4. "අත්තනාව කතං පාපං ....."

66701

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை மதிப்பீடு - 2019
Third Term Evaluation

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ශ්‍රේණිය தரம் Grade | 11 | විෂයය பாடம் Subject | බුද්ධ ධර්මය | පත්‍රය வினாத்தாள் Paper | II | පැය மணித்தியாலம் Hours | 02 |

* පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

* පළමුවෙනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් එක් එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

1) (i) ශිෂ්‍යයාගෙන් ගුරුවරයාට ඉටු විය යුතු යුතුකම් දෙකක් ලියන්න.

(ii) විපාක දෙන ආකාරය අනුව කර්මය සතරාකාර වේ. එම සතරාකාරය දක්වන්න.

(iii) ගිරිමානන්ද ස්වාමීන්වහන්සේට පෙන්වාදුන් පරිදි රෝග වැළඳීමට හේතුවන කරුණු දෙකක් පෙන්වා දෙන්න.

(iv) ආහාර ගැනීමේදී අනුගමනය කළයුතු සේඛියා ධර්ම දෙකක් ලියන්න.

(v) ශ්‍රද්ධාව බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

(vi) බුදුරජාණන් වහන්සේ සතු උත්තරීතර ගුණාංග දෙකක් සඳහන් කරන්න.

(vii) පාරමිතා පුහුණු කරන්නෙක් ඒවා කරුණු පහකින් සම්පූර්ණ කළ යුතු ය. ඉන් දෙකක් දක්වන්න.

(viii) "උට්ඨානවතො සතිමතො - සුචිකම්මස්ස නිසම්මකාරිනො" යන ධම්මපද ගාථාවේ ඉතිරි දෙපදය සම්පූර්ණ කරන්න.

(ix) නූතන යුගයට අයත් චිත්‍ර ශිල්පීන් දෙදෙනෙක් නම් කරන්න.

(x) සාහිත්‍ය නිර්මාණකරණයේ විශාරදත්වය ප්‍රකට කෙරුණු දඹදෙණි යුගයේ රචිත සාහිත්‍යය නිර්මාණ දෙකක් සඳහන් කරන්න.

( 2 × 10 = 20 )

2) (i) බුදු ගුණ, දහම් ගුණ, සඟ ගුණ ඇසුරෙන් තෙරුවන් ගුණ ගණන කීයදැයි දක්වන්න. (ල.2)

(ii) සඟ ගුණ තුනක් නම් කරන්න. (ල.3)

(iii) ඔබේ ගමේ විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේගෙන් සමාජයට ඉටුකෙරෙන සේවාවන් පිළිබඳ විස්තරයක් ලියන්න. (ල.5)

3) (i) ඉමස්මිං සති ඉදං හෝති
ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති
ඉමස්මිං අසති ඉදං න හෝති
ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති යන පාලි පාඨවල සිංහල අදහස ලියන්න. (ල.2)

(ii) ත්‍රිලක්ෂණය නම් කරන්න. (ල.3)

(iii) පසුගිය වාර විභාගයේ ඔබගේ බුද්ධ ධර්මය විෂයය ලකුණු අඩු මට්ටමක පැවතියේ නම් එය වර්ධනය කර ගැනීම සඳහා පටිච්ච සමුප්පාද න්‍යාය භාවිතා කරන ආකාරය විස්තර කරන්න. (ල.5)

4) (i) දස රාජ ධර්මවලින් දෙකක් සඳහන් කරන්න. (ල.2)

(ii) සප්ත අපරිහාණීක ධර්මවලින් තුනක් නම් කරන්න. (ල.3)

(iii) යහපත් රාජ්‍ය පාලනයක් සඳහා සතර සංග්‍රහ වස්තු උපයෝගී කර ගත හැකි ආකාරය පහදන්න. (ල.5)

5) (i) පුද්ගලයාගේ මෙලොව පරලොව දියුණුවට අදාළ වන කරුණු ඇතුළත් සූත්‍ර දේශනා දෙකක් නම් කරන්න. (ල.2)

(ii) දැතේ විරියෙන් දහදිය හෙළා ධාර්මිකව මුදල් ඉපයිය හැකි රැකියා තුනක් නම් කරන්න. (ල.3)

(iii) "තම දියුණුව රඳා පවතිනුයේ තම ක්‍රියාකාරීත්වය මත ය." ඉහත (i) හි සඳහන් සූත්‍ර දේශනා ඇසුරින් මෙම කරුණ සනාථ කිරීමට අදහස් දක්වන්න. (ල.5)

6) (i) දැහැමි වෙළඳාමේදී භාවිත නොකළයුතු උපක්‍රම දෙකක් සඳහන් කරන්න. (ල.2)

(ii) නොකළයුතු වෙළඳාම් තුනක් සඳහන් කරන්න. (ල.3)

(iii) "දැහැමි ධනය ගෙනෙයි සැපය" යන්න ධනය නිසා ලැබිය හැකි චතුර්විධ සැප ඇසුරින් පැහැදිළි කරන්න. (ල.5)

7) පහත මාතෘකාවලින් දෙකක් පමණක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) බෞද්ධ ස්තූපය
(ii) කණිෂ්ක ධර්ම සංගායනාව
(iii) වැලිවිට සරණංකර සංඝරාජ මාහිමි
(iv) සිව්බඹ විහරණය

( 5 × 2 = 10 )

***